# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1924/8 - 2015 ජූලි මස 20 වැනි සඳුදා - 2015.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/2011.

**2008 අංක 40 දරන ජාතික මංමාවත් පනත**

2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 වන සහ 14 වන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 89 (2) (ඇ) වගන්තිය යටතේ මහා මාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

කබීර් හෂීම්,
මහා මාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2015 ජූලි මස 17 වන දින,
බත්තරමුල්ලේ දී ය.

නියෝග

1. මෙම නියෝග 2015 අංක 2 දරන ජාතික මංමාවත් (ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝග -

(අ) 2011 නොවැම්බර් මස 8 වැනි දින අංක 1731/2 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද "ගාස්තු ගෙවිය යුතු දකුණු දිග ජාතික මහා මාර්ගය" ;

(ආ) 2014 පෙබරවාරි මස 19 වැනි දින අංක 1850/33 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද "ගාස්තු ගෙවිය යුතු ගාල්ල - මාතර ජාතික මහා මාර්ගය" ; සහ

(ඇ) 2015 ජූලි මස 8 වන දින අංක 1922/26 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 11 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද "ගාස්තු ගෙවිය යුතු පිටත වටරවුම් ජාතික මහා මාර්ගයේ කොට්ටාව - කඩවත කොටස" ට ද,

අදාළ වේ.

3. (1) ඉහත කී ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග භාවිත කරන සෑම වාහනයකම රියදුරෙකුගෙන් ඒ ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය එම රියදුරු විසින් භාවිත කිරීම සම්බන්ධයෙන් මෙම නියෝගවල උපලේඛනයේ "අ" කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි ගාස්තුවක් අයකරගනු ලැබිය යුතු ය.

(2) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයේ සම්පූර්ණ දුර ප්‍රමාණය හෝ ඉන් කොටසක් සම්බන්ධයෙන් එම ගාස්තුව අයකරගනු ලැබිය යුතු ය.

4. (1) යම් අන්තර් හුවමාරුවකින් ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයට ප්‍රවේශවන සෑම වාහනයක රියදුරකුම, ඒ මහා මාර්ගයේ ගමන් කිරීමට අවසර ලබා දීමට ප්‍රථමයෙන් ඒ අන්තර් හුවමාරුවේ සේවයේ යෙදී සිටින අයකැමිගෙන් ප්‍රවේශ පත්‍රයක් ලබාගත යුතු ය.

(2) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයේ ගමන් කරමින් තිබෙන වාහනයක රියදුරකු විසින්, මහා මාර්ගයෙන් පිටව යෑමේ අරමුණ සඳහා ඒ රියදුරා විසින් පසුකර යා යුතු අන්තර් හුවමාරුවේ ගේට්ටුවට පැමිණි විට, ඔහු ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයට ප්‍රවේශවීමේ දී අන්තර් හුවමාරුවෙන් ලබා ගත් ප්‍රවේශ පත්‍රය අයකැමි යටතට පත්කළ යුතු ය.

(3) අයකැමි විසින් ගෙවිය යුතු ගාස්තුව රියදුරු වෙත දැනුම් දිය යුතු වන අතර අන්තර් හුවමාරුවෙන් පිටවී යෑමට අවසර ලබාදීමට ප්‍රථමයෙන් ඒ මුදල රියදුරු විසින් ගෙවිය යුතු වන අතර අයකැමි විසින් ඒ ගෙවීම වෙනුවෙන් ලදු පතක් නිකුත් කළ යුතු ය.

5. (1) 4(1) වන නියෝගයේ සඳහන් කරන ලද ප්‍රවේශ පත්‍රයක් ලබාගත් සෑම රියදුරකුම එම ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයෙන් පිටවීම සඳහා ඔහු අපේක්ෂා කරන අන්තර් හුවමාරුවට ලඟා වන තෙක් එම ප්‍රවේශ පත්‍රය ඔහුගේ සන්තකයේ සුරක්ෂිතව තබාගත යුතු ය.

(2) පිටවීම සඳහා ඔහු අපේක්ෂා කරන අන්තර් හුවමාරුවේ ගේට්ටුවේ අයකැමි වෙත ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට නොහැකි වන අවස්ථාවක දී එම රියදුරු විසින් ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයේ වඩාත්ම දුරින් පිහිටි ප්‍රවේශයේ සිට සැබැවින්ම පිටවූ ස්ථානය දක්වා සම්පූර්ණ දුර ප්‍රමාණයම ගමන් කර ඇති අයකු ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව මෙම නියෝගවල උපලේඛනයේ ''අ'' කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි ගාස්තුවක් අයකරගනු ලැබිය යුතු ය.

6. (1) (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ මාර්ග සංවර්ධන අධිකාරිය විසින්, මෙම නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, එකී ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ග දිගේ අවශ්‍ය කරන ස්ථානවල ප්‍රමාණවත් තරම් ගේට්ටු සංඛ්‍යාවක් සවිකර ඇති බවට සහතික විය යුතු ය.

(2) ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය දිගේ එසේ සවිකරන ලද ගේට්ටුවල අයිතිය, පාලනය සහ නඩත්තුව අධිකාරිය සතු වන අතර එක් එක් ගේට්ටුව අයකැමි විසින් හසුරුවනු ලැබිය යුතු ය.

(3) (2) වන ඡේදයෙන් නියම කර ඇති පරිදි පිහිටුවා ඇති සෑම ගේට්ටුවක දී ම ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගයක් භාවිත කරන සෑම රියදුරකුගෙන්ම මෙම නියෝගවල උපලේඛනයේ "අ" කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි භාවිත කිරීමේ ගාස්තු වශයෙන් යම් මුදලක් එකතු කර ගැනීම සඳහා අයකැමි වග කිව යුතු ය:

එසේ වුවද, මෙම නියෝගවල උපලේඛනයේ "ආ" කොටසේ නිශ්චිතවම සඳහන් කර ඇති ගාස්තු ගෙවීමෙන් බැහැර කළ යුතු වර්ගයක වාහනයක් පදවන රියදුරකු වෙත මෙම නියෝගවල විධිවිධානයන් අදාළ නොවිය යුතු ය.

7. අයකැමි විසින්, නිශ්චිතව සඳහන් කර ඇති යම් වේලාවක දී දිනය තුළ එකතු කළ ගාස්තු අධිකාරිය විසින් තත්කාර්යය සඳහා බලය දෙන ලද නිලධරයකු වෙත භාරදිය යුතු අතර ඒ මුදල සම්බන්ධයෙන් කුවිතාන්සියක් ලබාගත යුතු ය.

8. ගාස්තු ලෙස එසේ එකතු කරගත් මුදල් අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු අතර, මෙම නියෝග අදාළ වන ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය සංවර්ධනය කර පවත්වාගෙන යාමේ කාර්ය සඳහා භාවිත කරනු ලැබිය යුතු ය.

9. මෙම නියෝගවල කාර්ය සඳහා -

"අයකැමි" යන්නෙන්, අන්තර් හුවමාරුවක ගේට්ටු හසුරුවනු ලබන නිලධරයෙකු අදහස් වේ;

"ගාස්තු ගෙවිය යුතු ජාතික අධිවේගී මාර්ගය" යන්නට කොට්ටාව (කි.මී.0.000) සිට පින්නදූව (කි.මී. 95.275) දක්වා වූ ගාස්තු ගෙවිය යුතු දකුණු දිග ජාතික මහා මාර්ගයත්, පින්නදූව (කි.මී.95.275) සිට ගොඩගම (කි.මී.124.800) දක්වා වූ ගාස්තු ගෙවිය යුතු ගාල්ල - මාතර ජාතික මහා මාර්ගය සහ ගාස්තු ගෙවිය යුතු පිටත වටරවුම් ජාතික මහා මාර්ගයේ කොට්ටාව - (කි.මී. 0.000) සිට කඩවත (කි.මී. 19.245) කොටස අදහස් වේ.

10. මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරන වාහනයක රියදුරකු වරදක් කරනු ලබන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු -

(අ) පළමුවන වතාවට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන්දහස නොඉක්මවන දඩයකට ; සහ

(ආ) දෙවන වතාවට හෝ ඊට වැඩි වාර ගණනකට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට,

යටත් විය යුතු ය.

11. 2014 මාර්තු මස 5 දින අංක 1852/36 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2014 අංක 1 දරන ජාතික මංමාවත් (ගාස්තු ගෙවිය යුතු) නියෝග ඒයටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගති විරහිතව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

# උපලේඛනය

## 'අ' කොටස



(3 වන සහ 6 වන නියෝග)

*ගාස්තු ගෙවිය යුතු දකුණු දිග ජාතික මහා මහා මාර්ගය (දකුණු අධිවේගී මාර්ගය), ගාල්ල - මාතර ජාතික මහා මාර්ගය සහ පිටත වටරවුම් ජාතික මහා මාර්ගය (කොට්ටාව - කඩවත කොටස) පළමුවන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)*

*(කි.මී. 9.35 කි.මී. 4.8 කි.මී. 5.1 කි.මී. 6 කි.මී. 8 කි.මී. 21 කි.මී. 11 කි.මී. 22 කි.මී. 12 කි.මී. 16 කි.මී. 12.4 කි.මී. 7.9 කි.මී. 9.9* අන්තර් හුවමාරුවන් අතර දුර ප්‍රමාණයන්

| | කඩවත (පිටවීම - C2) | කඩුවෙල (පිටවීම - C3)/ කොතලාවල (පිටවීම - C4) | අතුරුගිරිය (පිටවීම - C5) | කොට්ටාව (පිටවීම - S1) | කහතුඩුව (පිටවීම - S2) | ගැලනිගම (පිටවීම - S3) | දොඩන්ගොඩ (පිටවීම - S4) | වැලිපැන්න (පිටවීම - S5) | කුරුඳුගහහැතැප්ම (පිටවීම - S6) | බද්දේගම (පිටවීම - S7) | පින්නදූව (පිටවීම - S8) | ඉමදූව (පිටවීම - S9) | කොක්මාදූව (පිටවීම - S10) | ගොඩගම (පිටවීම - S11) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කඩුවෙල | 100 | | | | | | | | | | | | | |
| අතුරුගිරිය | 150 | 100 | | | | | | | | | | | | |
| කොට්ටාව | 150 | 100 | 100 | | | | | | | | | | | |
| කහතුඩුව | 200 | 150 | 150 | 100 | | | | | | | | | | |
| ගැලනිගම | 250 | 200 | 200 | 150 | 100 | | | | | | | | | |
| දොඩන්ගොඩ | 300 | 250 | 250 | 200 | 150 | 150 | | | | | | | | |
| වැලිපැන්න | 350 | 300 | 300 | 250 | 200 | 200 | 100 | | | | | | | |
| කුරුඳුගහහැතැප්ම | 400 | 350 | 350 | 300 | 250 | 250 | 150 | 150 | | | | | | |
| බද්දේගම | 450 | 400 | 400 | 350 | 300 | 250 | 200 | 200 | 100 | | | | | |
| පින්නදූව | 500 | 450 | 450 | 400 | 350 | 300 | 250 | 250 | 150 | 150 | | | | |
| ඉමදූව | 550 | 500 | 500 | 450 | 400 | 350 | 300 | 300 | 250 | 200 | 100 | | | |
| කොක්මාදූව | 600 | 550 | 550 | 500 | 450 | 400 | 350 | 300 | 250 | 200 | 150 | 100 | | |
| ගොඩගම | 650 | 600 | 600 | 550 | 500 | 450 | 400 | 350 | 300 | 250 | 200 | 150 | 100 | |

පළමුවන වර්ගයට අයත් වාහනවලට පහත දේ ඇතුළත් විය යුතු ය ;

| කාර් | |
|---|---|
|  | සියලුම කාර් |
|  | සියලුම ජීප් |
|  | සියලු සැලූන් ස්ටේෂන් වැගන් |
| ද්විත්ව කාර්ය වාහන | |
|  | සියලුම කැබ් රථ (තනි හා ද්විත්ව) |
|  | ආසන 9ක් දක්වා වූ සියලු මගී වෑන් රථ |
|  | දළ බර කිලෝ ග්‍රෑම් 3500 දක්වා වූ බඩු ප්‍රවාහන වෑන් සහ ට්‍රක් රථ |
| සැහැල්ලු මෝටර් ලොරි | |
|  | ඇක්සල් 2ක් සහ රෝද 4ක් සහිත ලොරි සහ ට්‍රක් |

උපලේඛනය (සම්බන්ධිතයි)

(3 වන සහ 6 වන නියෝග)



*ගාස්තු ගෙවිය යුතු දකුණු දිග ජාතික මහා මාර්ගය (දකුණු අධිවේගී මාර්ගය), ගාල්ල - මාතර ජාතික මහා මාර්ගය සහ පිටත වටරවුම් ජාතික මහා මාර්ගය (කොට්ටාව - කඩවත කොටස) දෙවන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)*

අන්තර් හුවමාරුවන් අතර දුර ප්‍රමාණයන්

*(කි.මි. 9.35 කි.මි. 4.8 කි.මි. 5.1 කි.මි. 6 කි.මි. 8 කි.මි. 21 කි.මි. 11 කි.මි. 22 කි.මි. 12 කි.මි. 16 කි.මි. 12.4 කි.මි. 7.9 කි.මි. 9.9*

| | කඩවත (පිටවීම - C2) | කඩුවෙල (පිටවීම - C3)/ කොතලාවල (පිටවීම - C4) | අතුරුගිරිය (පිටවීම - C5) | කොට්ටාව (පිටවීම - S1) | කහතුඩුව (පිටවීම - S2) | ගැලනිගම (පිටවීම - S3) | දොඩන්ගොඩ (පිටවීම - S4) | වැලිපැන්න (පිටවීම - S5) | කුරුඳුගහහැතැප්ම (පිටවීම - S6) | බද්දේගම (පිටවීම - S7) | පින්නදූව (පිටවීම - S8) | ඉමදූව (පිටවීම - S9) | කොක්මාදූව (පිටවීම - S10) | ගොඩගම (පිටවීම - S11) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කඩුවෙල | 150 | | | | | | | | | | | | | |
| අතුරුගිරිය | 150 | 100 | | | | | | | | | | | | |
| කොට්ටාව | 200 | 150 | 150 | | | | | | | | | | | |
| කහතුඩුව | 250 | 200 | 200 | 150 | | | | | | | | | | |
| ගැලනිගම | 300 | 250 | 250 | 200 | 150 | | | | | | | | | |
| දොඩන්ගොඩ | 400 | 350 | 350 | 300 | 250 | 200 | | | | | | | | |
| වැලිපැන්න | 500 | 450 | 400 | 350 | 300 | 250 | 200 | | | | | | | |
| කුරුඳුගහහැතැප්ම | 600 | 550 | 550 | 500 | 450 | 400 | 300 | 250 | | | | | | |
| බද්දේගම | 700 | 650 | 650 | 600 | 550 | 500 | 350 | 300 | 200 | | | | | |
| පින්නදූව | 800 | 750 | 750 | 700 | 650 | 600 | 450 | 400 | 250 | 200 | | | | |
| ඉමදූව | 900 | 850 | 850 | 800 | 750 | 700 | 650 | 550 | 400 | 300 | 150 | | | |
| කොක්මාදූව | 950 | 900 | 900 | 850 | 800 | 750 | 700 | 600 | 450 | 350 | 200 | 150 | | |
| ගොඩගම | 1000 | 950 | 950 | 900 | 850 | 800 | 750 | 700 | 500 | 400 | 300 | 200 | 150 | |

දෙවන වර්ගයට අයත් වාහනවලට පහත දේ ඇතුළත් විය යුතු ය ;

| සැහැල්ලු මෝටර් කෝච් | |
|---|---|
|  | ආසන 9ට වැඩි මගී ප්‍රවාහන වෑන් රථ |
|  | ආසන 9ත් 33ත් අතර සියලු බස් රථ |

## උපලේඛනය (සම්බන්ධිතයි)

(3 වන සහ 6 වන නියෝග)


*ගාස්තු ගෙවිය යුතු දකුණු දිග ජාතික මහා මාර්ගය (දකුණු අධිවේගී මාර්ගය), ගාල්ල - මාතර ජාතික මහා මාර්ගය සහ පිටත වටරවුම් ජාතික මහා මාර්ගය කොට්ටාව - කඩවත කොටස තෙවන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)*

අන්තර් හුවමාරුවන අතර දුර ප්‍රමාණයන්

*(කි.මී. 9.35 කි.මී. 4.8 කි.මී. 5.1 කි.මී. 6 කි.මී. 8 කි.මී. 21 කි.මී. 11 කි.මී. 22 කි.මී. 12 කි.මී. 16 කි.මී. 12.4 කි.මී. 7.9 කි.මී. 9.9*

| | කඩවත (පිටවීම - C2) | කඩුවෙල (පිටවීම - C3)/ කොතලාවල (පිටවීම - C4) | අතුරුගිරිය (පිටවීම - C5) | කොට්ටාව (පිටවීම - S1) | කහතුඩුව (පිටවීම - S2) | ගැලනිගම (පිටවීම - S3) | දොඩන්ගොඩ (පිටවීම - S4) | වැලිපැන්න (පිටවීම - S5) | කුරුඳුගහහැතැප්ම (පිටවීම - S6) | බද්දේගම (පිටවීම - S7) | පින්නදූව (පිටවීම - S8) | ඉමදූව (පිටවීම - S9) | කොක්මාදූව (පිටවීම - S10) | ගොඩගම (පිටවීම - S11) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කඩුවෙල | 200 | | | | | | | | | | | | | |
| අතුරුගිරිය | 250 | 200 | | | | | | | | | | | | |
| කොට්ටාව | 300 | 250 | 200 | | | | | | | | | | | |
| කහතුඩුව | 350 | 300 | 250 | 200 | | | | | | | | | | |
| ගැලනිගම | 450 | 400 | 350 | 250 | 200 | | | | | | | | | |
| දොඩන්ගොඩ | 650 | 600 | 550 | 450 | 400 | 300 | | | | | | | | |
| වැලිපැන්න | 800 | 750 | 650 | 600 | 500 | 450 | 250 | | | | | | | |
| කුරුඳුගහහැතැප්ම | 1050 | 1000 | 950 | 850 | 800 | 700 | 450 | 300 | | | | | | |
| බද්දේගම | 1200 | 1150 | 1100 | 1000 | 950 | 850 | 600 | 450 | 250 | | | | | |
| පින්නදූව | 1400 | 1350 | 1250 | 1200 | 1150 | 1050 | 750 | 650 | 350 | 250 | | | | |
| ඉමදූව | 1550 | 1500 | 1400 | 1350 | 1300 | 1200 | 900 | 800 | 500 | 350 | 200 | | | |
| කොක්මාදූව | 1650 | 1600 | 1500 | 1400 | 1350 | 1250 | 1000 | 850 | 600 | 450 | 250 | 200 | | |
| ගොඩගම | 1750 | 1700 | 1600 | 1550 | 1500 | 1400 | 1150 | 1000 | 750 | 600 | 400 | 250 | 200 | |

තෙවන වර්ගයට අයත් වාහනවලට පහත දේ ඇතුළත් විය යුතු ය ;

| | |
|---|---|
| මෝටර් කෝච් | |
|  | ආසන 33ට වැඩි සියලු බස් රථ |
| සැහැල්ලු මෝටර් කෝච් | |
|  | ඇක්සල් 2ක් සහ රෝද 6ක් සහිත ලොරි සහ ට්‍රක් රථ |
| මෝටර් ලොරි | |
|  | ඇක්සල් 3ක් සහිත මෝටර් ලොරි සහ ට්‍රක් රථ (දළ බර කිලෝ ග්‍රෑම් 17000ට වැඩි) |

## උපලේඛනය (සම්බන්ධිතයි)

(3 වන සහ 6 වන නියෝග)

*ගාස්තු ගෙවිය යුතු දකුණු දිග ජාතික මහා මාර්ගය (දකුණු අධිවේගී මාර්ගය), ගාල්ල - මාතර ජාතික මහා මාර්ගය සහ පිටත වටරවුම් ජාතික මහා මාර්ගය (කොට්ටාව - කඩවත කොටස) සිව්වන වර්ගයට අයත් වාහන සඳහා ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණයන් (රු.)*

අන්තර් හුවමාරුවන් අතර දුර ප්‍රමාණයන්

*(කි.මී. 9.35 කි.මී. 4.8 කි.මී. 5.1 කි.මී. 6 කි.මී. 8 කි.මී. 21 කි.මී. 11 කි.මී. 22 කි.මී. 12 කි.මී. 16 කි.මී. 12.4 කි.මී. 7.9 කි.මී. 9.9*

| | කඩවත (පිටවීම - C2) | කඩුවෙල (පිටවීම - C3)/ කොතලාවල (පිටවීම - C4) | අතුරුගිරිය (පිටවීම -C5) | කොට්ටාව (පිටවීම - S1) | කහතුඩුව (පිටවීම - S2) | ගැලනිගම (පිටවීම - S3) | දොඩන්ගොඩ (පිටවීම - S4) | වැලිපැන්න (පිටවීම - S5) | කුරුඳුගහහැතැප්ම (පිටවීම - S6) | බද්දේගම (පිටවීම - S7) | පින්නදූව (පිටවීම - S8) | ඉමදූව (පිටවීම - S9) | කොක්මාදූව (පිටවීම - S10) | ගොඩගම (පිටවීම - S11) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කඩුවෙල | 250 | | | | | | | | | | | | | |
| අතුරුගිරිය | 300 | 250 | | | | | | | | | | | | |
| කොට්ටාව | 350 | 300 | 250 | | | | | | | | | | | |
| කහතුඩුව | 450 | 350 | 350 | 250 | | | | | | | | | | |
| ගැලනිගම | 600 | 450 | 350 | 300 | 250 | | | | | | | | | |
| දොඩන්ගොඩ | 950 | 800 | 700 | 650 | 500 | 400 | | | | | | | | |
| වැලිපැන්න | 1150 | 1000 | 900 | 850 | 700 | 600 | 250 | | | | | | | |
| කුරුඳුගහහැතැප්ම | 1550 | 1400 | 1250 | 1200 | 1000 | 950 | 600 | 400 | | | | | | |
| බද්දේගම | 1750 | 1600 | 1400 | 1400 | 1350 | 1200 | 800 | 600 | 300 | | | | | |
| පින්නදූව | 2000 | 1800 | 1600 | 1550 | 1500 | 1400 | 1000 | 800 | 500 | 300 | | | | |
| ඉමදූව | 2200 | 1900 | 1800 | 1700 | 1600 | 1500 | 1100 | 1000 | 650 | 450 | 250 | | | |
| කොක්මාදූව | 2300 | 2000 | 1900 | 1800 | 1700 | 1600 | 1200 | 1100 | 750 | 550 | 350 | 250 | | |
| ගොඩගම | 2500 | 2100 | 2000 | 1900 | 1800 | 1700 | 1400 | 1200 | 1000 | 750 | 500 | 350 | 250 | |

සිව්වන වර්ගයට අයත් වාහනවලට පහත දේ ඇතුලත් විය යුතු ය ;

| බර මෝටර් කෝච් | |
|---|---|
|  | එකට ඈඳූ මෝටර් කෝච් දෙකක් සහිත බස් |
| **බර මෝටර් ලොරි** | |
|  | ඇක්සල් 4 ක් හෝ ඊට වැඩි සියලු රථ |

**උපලේඛනය**

**"ආ" කොටස**

(6 වන නියෝගය)

**ගාස්තු ගෙවිය යුතු දකුණු දිග ජාතික මහා මාර්ගය (දකුණු අධිවේගී මාර්ගය), ගාල්ල - මාතර ජාතික මහා මාර්ගය සහ පිටත වටරවුම් ජාතික මහා මාර්ගය කොට්ටාව - කඩවත කොටස භාවිත කරන්නන් සඳහා වූ ගාස්තු ගෙවීමෙන් බැහැර කර ඇති වාහන**

1. ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය ඔස්සේ යම් තාක් දුරක් යම් අවස්ථාවක දී ගමන් කරනු ලබන ජනාධිපති ආරක්ෂක රථ පෙළට අයත් වන සියලු වාහන.

2. ගාස්තු ගෙවිය යුතු ජාතික මහා මාර්ගය ඔස්සේ යම් තාක් දුරක් යම් අවස්ථාවක දී ගමන් කරනු ලබන අගමැති ආරක්ෂක රථ පෙළට අයත් වන සියලු වාහන.

08 - 45

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.